Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත තනතුර සඳහා වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රය සම්පූර්ණ කර ලේකම්, ප්‍රාදේශීය සභාව, වෙන්නප්පුව යන ලිපිනයට 2019.05.31 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | පුස්තකාල උපස්ථායක ( පුස්තකාල සහායක) | 03 | රා.ප.ච. 3/2016 (PL1-2016) අනුව<br>රු. 24,250-250x10 -270x10 -300x10 -330x12-රු. 36,410 කි.<br>මෙය 2020.01.01 සිට ක්‍රියාත්මක වන අතර, එතෙක් ඉහත චක්‍රලේඛයේ උපබෙන II අනුව වැටුප හිමි වේ. | අ.පො.ස.(සා.පෙ.) දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන 02ක් සහිතව විෂයයන් 06 ක් සමත් වීම. |

03. *පැවරෙන කාර්යභාරය* -

- ❖ පුස්තකාල ප්‍රමිතිකරණ අනුව පොත්පත් ගබඩා කිරීම,නිකුත් කිරීම හා ආරක්ෂා කිරීම සඳහා පුස්තකාලයාධිපතිට සහාය වීම හා පුස්තකාලයේ පවිත්‍රතාවය පවත්වා ගැනීම.

04. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවය කරනු ලබන තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/ගිවිසුම් හා ස්ථිර අයගේ අයදුම්පත් කෙරෙහි වැඩි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

05. වයස- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
(දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයට මෙම උපරිම සීමාව බල නොපැවැත්වේ)

06. *වෙනත් සුදුසුකම් :*

i. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

ii. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

iii. අයදුම්කරු ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වසර 3 කට නොඅඩු කාලයක් තුල ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ග්‍රාම නිලධාරි සහ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළයුතුය)

iv. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ආයතන විසින් සේවයෙන් පහකරනු ලැබූ අයෙක් නොවිය යුතු අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

v. දණ්ඩ නීති සංග්‍රහය යටතේ අධිකරණය මගින් දඬුවම් පමුණුවනු ලැබූ අයෙකු නොවිය යුතුය.

07. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය.

ii. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලකට දායක මුදල් ගෙවිය යුතුය.

iii. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

iv. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද, මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තු නියෝගවලටද වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

08. අයදුම්පත් - අයදුම්කරුවන් මෙම උපලේඛනයේ දැක්වෙන ආකෘතියට අනුව පිළියෙල කරගත් අයදුම්පත් 2019.05.31 දිනට පෙර ''ලේකම්, ප්‍රාදේශීය සභාව, වෙන්නප්පුව'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ''පුස්තකාල උපස්ථායක තනතුර සඳහා අයදුම්පත'' යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන හා තැපෑලේදී නැතිවන අයදුම්පත් පිළිබඳව වගකියනු නොලැබේ.

09. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

10. අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේදී සහතික ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය

(ii) අධ්‍යාපන සහතික

(iii) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් සහතිකය

(iv). මෑතකදි ලබාගත් චරිත සහතික දෙකක් (එකක් ග්‍රාම නිලධාරියාගෙන් එවිය යුතුය)

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදන අවලංගු කිරීම ආදි සියලු බලතල වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ඩබ්. ඩී. ලූෂන්,
ලේකම්,
වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව.

2019 අප්‍රේල් මස 18 වැනි දින
වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී

ආදර්ශ අයදුම්පත්‍රය

**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව**

*පුස්තකාල උපස්ථායක තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමග):————————————.
   මුලකුරුවලින් හැඳින්වෙන නම :————————————.
2. තැපැල් ලිපිනය :————————————.
3. ස්ථිර පදිංචි ලිපිනය :————————————.
4. දුරකතන අංකය :————————————.
5. උපන් දිනය : අවුරුද්ද :—————— මාසය :—————— දිනය :——————
6. අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු :—————— මාස :—————— දින :——————
7. විවාහක / අවිවාහක බව :————————————.
9. ජාතිය :————————————.
10. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචියෙන්ද යන වග :——————.
11. අධ්‍යාපන සුදුසුකම් :————————————.
12. වෘත්තීය සුදුසුකම් :————————————.
13. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් :——————.
    I. දැනට දරන තනතුර :——————.
    II. එම තනතුරට පත් වූ දිනය :——————.
    III. එම පත්වීමේ ස්වභාවය (ස්ථිර / තාවකාලික /අනියම් / ආදේශක / කොන්ත්‍රාත් / ගිවිසුම්) පදනම මතද? :————
14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? :————————————

මෙහි සඳහන් මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි.මෙහි ඇතුලත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————